Department of Education Sabaragamuwa Province Weekly school

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා

2021

සතිය : 03

6 ශ්‍රේණිය

සකස් කිරීම :

# නෙත පිනවන විසිතුරු ශාක

විසිතුරු ශාක මගින් පරිසරයට වර්ණවත් බවක් හා අලංකාරයක් ගෙන දෙයි. ඇතැම් ශාකවල මල් අතිශයින් ප්‍රසන්න පෙනුමක් ලබා දෙන අතර සමහර ශාක වර්ණවත් පත්‍ර වලින් සමන්විත වේ. මෙම සෑම ශාකයකට ම සම්මත විද්‍යාත්මක නාමයක් ඇත. එමෙන්ම එම ශාක ප්‍රචලිත විවිධ නම් පවතී.

ගෙමිදුල හෝ අවට පරිසරය අලංකාර කිරීමේ දී යොදාගන්නා මෙම විසිතුරු ශාක වර්ග හඳුනාගැනීම අපට බොහෝ ප්‍රයෝජනවත් වේ.

1) අපගේ නිවෙස් වල බහුලව දැකිය හැකි විසිතුරු ශාක කිහිපයක් පහත දක්වා ඇත.
(කෝලියාස්, සීනියාස්, බිගෝනියා, සෙන්සවේරියා, ජර්බෙරා, උඩවැඩියා, ඇස්පෙතියා)
මෙම ශාක පහත කාණ්ඩ වලට ගැලපෙන පරිදි බෙදා දක්වන්න.
   i. විසිතුරු පත්‍රික ශාක
   ii. අලංකාර මල් සහිත ශාක

2) වැඩීමේ විලාශය අනුව ශාක වර්ග කල හැකි ආකාරය පහතින් දක්වා ඇත. එම එක් එක් ශාක කාණ්ඩයට අයත් ශාක සඳහා උදාහරණ දෙක බැගින් ලියා දක්වන්න.
   i. වැල්
   ii. එල්ලා වැටෙන ශාක
   iii. කේතු ආකාර ශාක
   iv. කුරු ශාක

3) විසිතුරු ශාක බඳුන්ගත කිරීමේ දී බඳුන සකස්කර ගන්නා ආකාරය රූප සටහනින් දැක්වේ. එහි a, b, c, d හා e කොටස් නම් කරන්න.

